ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.05.02** **චක්‍රලේඛ අංක : 37/2026**

**සියළුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

**බාලදක්ෂ නායක – ලී පදක්කම් පුහුණුව**

**156 වන IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාව**
**2026 ජුනි මස 03 සිට 09 දක්වා**
**පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී**

**බාලදක්ෂ** අංශයේ III අදියර සාර්ථකව නිම කළ, **බාලදක්ෂ නායක/නායිකාවන්** සඳහා **බාලදක්ෂ** අංශයේ IV අදියර උසස් පාඨමාලාව **2026** ජුනි මස **03** වන බදාදා සිට **09** වන අඟහරුවාදා දක්වා **පීඩෲ බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේ දී** පුහුණුකිරිමේ නායක **ඒ කේ මහේන්ද්‍රන් මහතාගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

**2026** මැයි මස **16** සිට **22** දක්වා පැවැත්වීමට නියමිත **155** වන හතර වන අදියර බාලදක්ෂ උසස් පාඨමාලාව පුහුණුකිරිමේ නායක **ඒ කේ මහේන්ද්‍රන් මහතාගේ** අධ්‍යක්ෂණය යටතේ පැවැත්වීමට නියමිතව තිබුන ද එහි **පාඨමාලා අධ්‍යක්ෂ ලෙස දේශාන් මිලින්ද මහතා** පත් කර ඇත.

**156** පාඨමාලාව සඳහා මේ සමග අමුණා ඇති අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර, **2026 මැයි මස 08 වන දිනට ප්‍රථම** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ පුහුණුකිරිමේ අංශයට යොමු කරවීමට කටයුතු කරන්න.

**පාඨමාලා ගාස්තුව : රු. 6,000/- කි.**

**සම්මුඛ පරීක්ෂණය :**
**2026 මැයි මස 13 වන බදාදා දින පෙ.ව 10.00 ට** ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වෙන **සම්මුඛ පරීක්ෂණයට සම්පූර්ණ බාලදක්ෂ නිළ ඇඳුමින් පැමිණිය යුතු ය.**

- **IV අදියර බාලදක්ෂ නායක උසස් පාඨමාලාවට සහභාගීවීමට තිබිය යුතු සුදුසුකම්**

  i. III අදියර සාර්ථකව නිමා කර තිබීම.
  ii. **2025/2026** වසර සඳහා අධිකාරි පත්‍රයක් ලබා තිබීම හෝ **2025/2026** වසරට නවීකරණය කර තිබීම.
  iii. **මීට පෙර වෙනත් අංශයකින් IV අදියර පාඨමාලාවක් හදාරා ඇත්නම්, එම අංශයෙන් ලී පදක්කම දිනා, එම අංශයට වසර 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.**
  iv. **2 වන අදියර සහතිකය (2 වන අදියරින් පසු පාඨමාලාව පටන් ගන්නා දිනට මාස 06 ක සේවා කාලයක් තිබිය යුතු ය.)**

65
9
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131 / +94 11 2 433 512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

➢ <u>**සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේ දී රැගෙන ආ යුතු දේ :**</u>

1. තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන ආ යුතු ය.
2. දින **06** ක් ප්‍රායෝගික ව නේවාසික පුහුණුව ලැබීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයේ සිටින බවට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.
3. **2** වන අදියර සහතිකය
4. වලංගු අධිකාරී පත්‍රයේ පිටපතක්
5. බාලදක්ෂ නායක ප්‍රගති පුහුණු වාර්තා පොත (**1-5** පොත) සම්පූර්ණ කර පැමිණීම.
6. එදින සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වුවහොත් පාඨමාලා ගාස්තු ගෙවීමට මුදල් රැගෙන ආ යුතු ය.

<u>**සැලකිය යුතු කරුණු**</u> **:**

- ✓ අධිකාරී පත්‍රයක් නොමැති කිසිවකු පාඨමාලාවට ඇතුලත් නොකෙරේ.
- ✓ පාඨමාලාවට ඇතුළත් කිරීමෙන් පසු දැනුම් දීමක් කර, සහභාගි නොවුවහොත් පමණක් ගෙවූ මුදලින් 75% ක් ආපසු ගෙවනු ලැබේ.

ඉදිරි කටයුතු සංවිධානය කිරීමේ පහසුව උදෙසා නියමිත කාලය තුළ දී අයදුම් පත්‍ර යොමු කරවීමට කටයුතු කරණ ලෙස කාරුණික ව දැනුම් දෙමු.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

| | |
|---|---|
| **කර්නල් පද්මලාල් පෙරේරා** | **නිතීඥ මනෝජ් නානායක්කාර** |
| **ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්** | **ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්** |

<u>පිටපත -</u> 1. ජාතික බාලදක්ෂ මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්

2. සභාපති/විධායක කමිටු සභාපති/ගරු ලේකම්/ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය